# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 38 දරන ණය සහන සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 ජූනි මස 2 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1981 ජූනි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 65 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 38 දරන ණය සහන සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 ජූනි මස 2 වන දින]

එල්. ඩී.—ඕ. 6/79.

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 23 දරන ණය සහන සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 38 දරන ණය සහන සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 23 දරන ණය සහන සභා පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දක්වෙන, උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 23 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අනියම් සේවකයකු හෝ යළි සේවයේ යොදවන ලද විශ්‍රාමිකයකු හෝ ගිවිසුම් පදනමක් මත සේවයේ යොදවන ලද සේවකයකු හෝ නොවන සෑම සේවකයකු ම ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වේ නම්, ඒ දෙපාර්තමේන්තුව සඳහා පිහිටුවනු ලැබූ ණය සහන සභාවේ සාමාජිකයකු විය යුතුය :

එසේ වුවද, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයකින් අමාත්‍යවරයා විසින් මේ වගන්තියේ කාර්ය සඳහා අනුමත කරනු ලැබුවා වූ ද, අසනීපයක් හෝ ආපදාවක් ඇති වූ අවස්ථාවන්හි දී ස්වකීය සාමාජිකයන්ට ණය පහසුකම් හෝ සහන සැලසීමේ හෝ වෙනත් අන්දමක මුදල් ආධාර දීමේ කාර්යය සඳහා පිහිටුවනු ලැබුවා වූ ද යම් සභාවක සාමාජිකයකු වන්නා වූ සේවකයෙක් එවැනි යම් ණය සහන සභාවක සාමාජිකයකු වීමට බැඳී නොමැත්තේ ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් වගන්තිය එහි ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 3අ වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය :— — 3අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"ණය සහන සභා විසුරුවා හැරීම.

3අ. මේ පනතේ 3 (1) වන වගන්තිය ප්‍රකාර ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් සඳහා ණය සහන සභාවක් හෝ ණය සහන සභා පිහිටුවනු ලැබීමෙන් පසු, ඒ ණය සහන සභාව හෝ ණය සහන සභා හෝ වෙනස් කිරීම අවශ්‍ය බව සහ උචිත බව ණය සහන සභා අධ්‍යක්ෂවරයාට පෙනී යන්නේ නම්, ණය සහන සභා අධ්‍යක්ෂවරයා විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව ඒ ණය සහන සභාව හෝ ණය සහන සභා විසුරුවා හැර, එය හෝ ඒවා හෝ වෙනුවට, අවස්ථාවෝචිත පරිදි, අලුත් ණය සහන සභාවක් හෝ ණය සහන සභා, මේ පනතේ 3 (1) වන වගන්තිය ප්‍රකාර පිහිටුවනු ලැබිය හැකි ය.".

2—ඒ 55481—10,350 (81/03)

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" කළමනාකාර කාරක සභාව.

4. (1) ණය සහන සභාවක කටයුතු කළමනාකාර කාරක සභාවක් විසින් පරිපාලනය කළ යුතු ය. ඒ කාරක සභාව, සභාපතිවරයකුගෙන් ද ප්‍රථම සාමාජිකයන් පනස් දෙනා සඳහා නියෝජිතයන් පස් දෙනකු වශයෙනුත් ඊළඟ අමතර සාමාජිකයන් පනස් දෙනා හෝ ඉන් කොටසක් සඳහා එක් නියෝජිතයකු වශයෙනුත් වූ පදනමක් මත තෝරා ගනු ලබන නියෝජිතයන් විසි එක් දෙනකුට නොවැඩි නියෝජිතයන් සංඛ්‍යාවකින් ද සමන්විත විය යුතු ය :

එසේ වුව ද, ණය සහන සභාවේ සාමාජිකයන් ගෙන් යම් විශේෂ කණ්ඩායමක් හෝ පන්තියක් කළමනාකාර කාරක සභාවෙහි නියෝජනය වී නොමැති බවට ණය සහන සභා අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වුවහොත් ඒ කළමනාකාර කාරක සභාවට නියෝජිතයන් තිදෙනකුට නොවැඩි සංඛ්‍යාවක් ඔහු විසින් නම් කරනු ලැබිය හැකි ය :

එසේම තවදුරටත්, අදාළ සේවා නියුක්තියේ ස්වභාවය හෝ සේවා නියුක්ති ස්ථානය අනුව යම් ණය සහන සභාවක් විසින් එහි කළමනාකාර කාරක සභාවට නියෝජිතයන් තෝරා පත්කර ගැනීම ක්‍රියාත්මක කළ නොහැකි යයි ණය සහන සභා අධ්‍යක්ෂවරයා විසින් සලකනු ලබන අවස්ථාවක දී එවැනි යම් ණය සහන සභාවකට පත් කළ යුතු සියලු නියෝජිතයන් ඔහු විසින් නම් කරනු ලැබිය හැකිය.

(2) (අ) යම් දෙපාර්තමේන්තුවක ප්‍රධානියා හෝ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නම් කරනු ලබන ඒ දෙපාර්තමේන්තුවේ නිලධරයකු හෝ ඒ දෙපාර්තමේන්තුව සඳහා පිහිටුවනු ලැබූ ණය සහන සභාවක කළමනාකාර කාරක සභාවේ සභාපතිවරයා විය යුතු ය.

(ආ) යම් දෙපාර්තමේන්තුවක ප්‍රධානියා, ඒ දෙපාර්තමේන්තුව සඳහා පිහිටුවනු ලැබූ ණය සහන සභාවක කළමනාකාර කාරක සභාවේ කටයුතු අධීක්ෂණය කිරීමේ ද ඒ ණය සහන සභාවේ වාර්තා සහ ගිණුම් නිසියාකාරව පවත්වාගෙන යාමේ ද වග කීම දැරිය යුතු ය.

(ඇ) (i) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු එකකට වැඩි ගණනක් සඳහා එක් ණය සහන සභාවක් පිහිටුවීමට 3(1) වන වගන්තිය යටතේ ණය සහන සභා අධ්‍යක්ෂවරයා විසින් බලය දී ඇති අවස්ථා

වක, ඔහු විසින්, අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් අතුරින් එක් දෙපාර්තමේන්තු ප්‍රධානියකු ඒ ණය සහන සභාවේ කළමනාකාර කාරක සභාවේ සභාපති වශයෙන් නම් කරනු ලැබිය හැකි ය.

(ii) මේ ඡේදය යටතේ නම් කරනු ලැබූ දෙපාර්තමේන්තු ප්‍රධානියකු විසින්, සභාපතිවරයා ලෙස කටයුතු කිරීමට, තම දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකු නම් කළ හැකි ය.

(3) තම කාර්ය කිරීමෙහි ලා සිදු කරන ලද අයථා පාලනය, වංචාව හෝ නොසැලකිලිමත්කම නිසා හෝ යම් විධානයක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම නිසා හෝ ණය සහන සභාවේ කළමනාකාර කාරක සභාවේ සාමාජිකයකු ඉවත් කිරීම අවස්ථාවෝචිත යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නේ නම් එවැනි සාමාජිකයකු අමාත්‍යවරයා විසින් එසේ ධුර යෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. එවැනි ඉවත් කිරීමක් කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නො ලැබිය යුතු ය.

(4) (අ) ණය සහන සභාවක කළමනාකාර කාරක සභාව විසින් ස්වකීය කාර්ය කිරීමෙහි ලා සිදු කරන ලද අයථා පාලනය, වංචාව හෝ නො සැලකිලිමත්කම නිසා හෝ යම් විධානයක් අනුව ක්‍රියා කිරීම ඒ කාරක සභාව විසින් පැහැර හැර තිබීම නිසා හෝ ඒ කාරක සභාව විසුරුවා හැරීම අවස්ථාවෝචිත යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නේ නම්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍ර යේ පළ කරනු ලබන නියමයක් මගින් ඒ නියම යෙහි සඳහන් කරනු ලබන දිනක සිට ක්‍රියාත්මක වන පරිදි ඒ ණය සහන සභාවේ කළමනාකාර කාරක සභාව විසුරුවා හරිනු ලැබිය හැකි ය. අමාත්‍ය වරයා විසින් කරන ලද නියමය කිසිම අධිකරණ යක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(ආ) එසේ (අ) ඡේදය යටතේ යම් නියමයක් කරන ලද අවස්ථාවක දී, අලුත් කළමනාකාර කාරක සභාවක් තෝරා පත් කිරීම කළ යුත්තේ කවර කාල පරිච්ඡේදයක් තුළ දී ද යන්න ණය සහන සභා අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(5) කළමනාකාර කාරක සභාවක ධුර කාලයක් තුළ දී ඒ කාරක සභාවේ ඇති වන යම් පුරප්පාඩු වක් ණය සහන සභා අධ්‍යක්ෂවරයා විසින් කරනු ලබන නම් කිරීම් මගින් පිරවිය හැකි ය. එසේ නම් කළ සාමාජික සංඛ්‍යාව, කවර අවස්ථාවකවත් ඒ කාරක සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් දෙකෙන්

පංගුවක් නොඉක්මවිය යුතු ය. එවැනි කාරක සභාවකට නම් කරනු ලබන සාමාජිකයකු, ඒ කාරක සභාවේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කොටස සඳහා ධුරය දැරිය යුතු ය.".

5අ සහ 5ආ යන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 5අ සහ 5ආ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :—

"අතුරු කළමනාකාර කාරක සභාව.

5අ. (1) ණය සහන සභාවක කළමනාකාර කාරක සභාවක් 4 වන වගන්තිය යටතේ විසුරුවා හැර ඇති අවස්ථාවක දී හෝ ණය සහන සභාවකට කළමනාකාර කාරක සභාවක් නොමැති අවස්ථාවක දී හෝ එවැනි ණය සහන සභාවක කළමනාකාර කාරක සභාවේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා සාමාජිකයන් පස් දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත වන අතුරු කළමනාකාර කාරක සභාවක් ණය සහන සභා අධ්‍යක්ෂවරයා විසින් නම් කළ යුතු ය.

(2) එවැනි එක් එක් අතුරු කළමනාකාර කාරක සභාවක සභාපති, ලේකම් සහ නියෝජ්‍ය ලේකම්, (1) වන උපවගන්තිය යටතේ ණය සහන සභා අධ්‍යක්ෂවරයා විසින් නම් කරන ලද සාමාජිකයන් අතුරින් ඔහු විසින් පත් කරනු ලැබිය යුතු ය.

උපදේශක කාරක සභාව.

5ආ. ණය සහන සභා දෙපාර්තමේන්තුවේ කට යුතු කරගෙන යාමෙහි ලා සහාය වීමේ කාර්යය සඳහා ණය සහන සභාවල සාමාජිකයන් එකොළොස් දෙනකුට නොවැඩි ගණනකින් සමන්විත උපදේශක කාරක සභාවක් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය. ඒ කාරක සභාවේ සාමාජිකයන් අතුරින් යටත් පිරිසෙයින් පස් දෙනකුවත්, ලියාපදිංචි කළ වෘත්තීය සමිතිවල සාමාජිකයන් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) ණය සහන සභා දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන ප්‍රධාන අරමුදලක් තිබිය යුතු අතර, පහත දැක්වෙන මුදල් ඒ ප්‍රධාන අරමුදලට බැර කරනු ලැබිය යුතු ය :—

(අ) ණය සහන සභාවල සාමාජිකයන්ගේ මාසික දායක මුදල් ;

(ආ) ණය සහන සභාවල කටයුතු කරගෙන යාම සඳහා ඒකාබද්ධ අරමුදලින් වෙන් කරනු ලබන සියලු මුදල් ;

(ඇ) ණය සහන සභා විසින් උපයනු ලබන සියලු ලාභ ;

(ඈ) සාමාජිකයන්ට දෙනු ලැබූ ණය මුදල්වලින් ලැබෙන පොළිය ; සහ

(ඉ) ණය සහන සභා අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් යම් මුදල්.''; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(3) ප්‍රධාන අරමුදලෙහි වූ යම් අතිරික්ත මුදලක්, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි ආකාරයට ආයෝජනය කළ යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— 8අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"පුනරුත්ථාපන අරමුදල.

8අ. (1) ණය ගැතිවී සිටින සාමාජිකයන් පුනරුත්ථාපනය කිරීමට සහාය වීමේ කාර්යය සඳහා පුනරුත්ථාපන අරමුදලක් ණය සහන සභා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන හා ක්‍රියාත්මක කරගෙන යා යුතු ය.

(2) පහත දැක්වෙන මුදල්, එනම්—

(අ) කවර වූ හෝ ප්‍රභවයකින් ලැබෙන සියලු පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන ; සහ

(ආ) පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කර දෙනු ලබන මුදල් පුනරුත්ථාපන අරමුදලට ගෙවිය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) ඒ උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(අඅ) අවස්ථාවෝචිත පරිදි, ණය සහන සභාවක කළමනාකාර කාරක සභාවක හෝ අතුරු කළමනාකාර කාරක සභාවක හෝ රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය ඇතුළුව, රැස්වීම් පැවැත්වීමට අදාළ කාර්ය පරිපාටියට සම්බන්ධ සියලු කරුණු ;";

(ii) ඒ උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) ණය සහන සභාවක කළමනාකාර කාරක සභාව තෝරා පත් කිරීම හා සම්බන්ධ සියලු කරුණු ;";

(iii) ඒ උපවගන්තියේ (ඈ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඈ) ප්‍රධාන අරමුදල, ප්‍රාදේශීය අරමුදල් සහ පුනරුත්ථාපන අරමුදල පරිපාලනය කිරීම ;";

(iv) ඒ උපවගන්තියේ (ඌ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඌඌ) උපදේශක කාරක සභාවේ කාර්ය සහ කටයුතු ;"; සහ

(v) ඒ උපවගන්තියේ (එ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(එ) ප්‍රධාන අරමුදලේ, ප්‍රාදේශීය අරමුදල්වල සහ පුනරුත්ථාපන අරමුදලේ ගිණුම් පවත්වාගෙන යාම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ඉවත් කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.